“සැබැවින්ම මගෙන් පසුව බලපෑම් හා නුඹලා පිළිකුල් කරන කටයුතු සිදුවනු ඇත.” 'අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ අපට නියෝග කරනුයේ කුමක්ද?' යැයි ඔවුහු විමසා සිටියෝය. එතුමා: “නුඹලා මත පැවරුණු වගකීම් නුඹලා ඉටු කරමින් නුඹලාට හිමි දෑ අල්ලාහ්ගෙන් ඉල්ලා සිටීමය.” යැයි පැවසූහ

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “සැබැවින්ම මගෙන් පසුව බලපෑම් හා නුඹලා පිළිකුල් කරන කටයුතු සිදුවනු ඇත.” 'අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ අපට නියෝග කරනුයේ
කුමක්ද?' යැයි ඔවුහු විමසා සිටියෝය. එතුමා: “නුඹලා මත පැවරුණු වගකීම් නුඹලා ඉටු කරමින් නුඹලාට හිමි දෑ අල්ලාහ්ගෙන් ඉල්ලා සිටීමය.” යැයි පැවසූහ.
[صحيح] [متفق عليه]

මුස්ලිම්වරු පාලනය කරන ඇතැම් භාරකරුවන් බිහි වනු ඇත. ඔවුන් මුස්ලිම්වරුන්ගේ වස්තුවට හා අනෙකුත් ලෞකික කටයුතුවලට බලපෑම් කරනු ඇත. ඔවුන් සිතන පතන පරිදි ඒවා අවභාවිතා කරනු ඇත. එහි ඇති මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් ගැන නොසළකා ඒවා උල්ලංඝනය කරනු ඇතැ යි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ආගම තුළ ඔබ පිළිකුල් කරන කටයුතු ඔවුන් විසින් ක්රියාත්මක කරනු ඇත. එම තත්ත්වයේ ඔවුන් සිදු කළ යුත්තේ කුමක් දැ?යි සහාබාවරු විමසා සිටියහ. ඔවුන් ධනය අවභාවිතා කරමින් ඔබේ අයිතීන් වැළැක්වීම, ඔවුනට සවන් දීමේ හා ඔවුනට අවනත වීමේ වගකීමෙන් ඔබව වළක්වන්නේ නැත. ඔබ ඉවසීමෙන් කටයුතු කළ යුතුය; සවන් දිය යුතුය; අවනත විය යුතුය. තවද කටයුතුවල දී ඔවුන් සමග ගැටලු ඇති කර නො ගත යුතුය. ඔබේ අයිතීන් ඔබ අල්ලාහ්ගෙන් පතන්න. ඔවුන් දැහැමියන් කරන මෙන් ද ඔවුන්ගේ අපරාධ හා නපුරුකම්වලින් ආරක්ෂා කරන මෙන් ද ඔබ අල්ලාහ්ගෙන් පතන්න.

http://www.sunnah.global/hadeeth/si/show/3156